


# චිත්‍රලතාගේ චිත්‍ර ලතාව



සිසිර දිසානායක

"මොකෝ බිල්ලෙක් වගේ මූණ දිහා ම බලාන ඉන්නෙ? හරියට මූණ කන්න වගේ...."

චිත්‍රලතා ඒ කිව්වේ පින්සලට. පන්ති මිත්‍ර සාදයෙන් පස්සෙ පින්සලට චිත්‍රලාතව මුණගැහුණෙ කාලෙකින්. කෝච්චියේ තමුන්ගේ ඉස්සරහින් ඇවිත් වාඩි වෙනකල්ම පින්සල චිත්‍රලාතව දැක්කෙ නෑ.

"අඳුනා ගන්නත් බැරි තරම්. ඒ තරමට " මේකප්ස් ....... !" පින් චිත්‍රලතාගේ මූණේ රූප ලාලිත්‍යය මොහොතක් වින්දා.

"කව කටුවෙන් රවුම් කරලා ඇඳපු ඇහි බැම, අඩ් කෝදුව තියලා ඇඳපු නහය දෙපැත්තේ අඳුරු පාට, දෙතොල් වටේට කළුවට ඇඳපු ඉරි, සායම් පොගවපු දෙතොල්......"

"ඇති, ඇති වරුණාව.....!" චිත්‍ර ලතාට



කේන්තියි.

"කොහේ යන ගමන්ද මේ ගොම්මංකරේ.....?"

"පින්ට මං අර දවසක් කිව්වේ. 'ආර්ටිස්ට්ලාගේ ක්ලබ්' එකක මං කරන පාර්ට් ටයිම් ජොබ් එක ගැන.."

"හැබෑ නේන්නං...අමතකම වුනානේ. ඒ ගැන තව ටිකක් කතා කරන්නත් ඕනකම නං තියෙනවා....චිත්‍රා, ඔයාට වෙලාවක් තියෙනවනං කියන්න."

"මට අද නං ටිකක් වෙලා තියෙනවා"

"එහෙම නං කෝපි කෝප්පයක් බොන ගමන් පොඩ්ඩක් කතා කරමුද?" දෙන්නා "පාර්ලිමන්ට්" දුම්රියපොළෙන් බැහැලා "මෙල්බර්න් ෆෙඩරේෂන් ස්ක්වෙයා" ළග තිබුණ කෝපි කඩේකට ගියා.

එතන එළිමහනේ අටවලා තිබුණ කුඩයක් යට වාඩිවෙලා " කැපිච්නෝ" කෝපි දෙකක් රස විඳින ගමන් කතාව පටන් ගත්තා.

"අපි ගියපාර ඔය ගැන කතා කළේ කවද්ද?" චිත්‍රලතා ඇහුවා
"මං හිතන්නේ 2011 ජූලි ... මාසෙ විතර. ඒත් චිත්‍රා මට ආයෙත් මුලට යන්න ඕන නෑ. තේරුමක් නෑනේ..." පින් හරිබරි ගැහුණා.

"මං කැමතියි ඔය නග්න රූප අඳිනකොට තෝරගන්න ඉරියව් ගැන ටිකක් දැනගන්න....." පින් මුල පිරුවා.

"මිනිස් සිරුර ස්ථිති (static) නැත්නම් අනම්‍යශීලී දෙයක් වෙන්න ඕන නෑ. ඒ වගේම චිත්‍රයක් අඳින කලාකාරයෙක් කම්මැලි හිතෙන කාය රේඛා (body lines) අඳින්න කැමතිත් නෑ. ඒ අයට ඕන කරන්නේ නැමුණ, ඇඹරී ගිය (twists) ශරීරයකින් නිර්මාණය වෙන "බොඩි ලයින්ස්" නැත්නම් කාය රේඛා අඳින්න."

"අපි ඉඳගෙන නම් ඉන්නෙ අඳින අය බලාපොරොත්තු වෙනවා අපි වෙනත් පැත්තකට හැරිලා ඉග, උකුල වාගේ අග පසග වලට ට්විස්ට් එකක් නැත්නම් ඇඹරීමක් ඇතිවෙන ඉරියව්වක්. ඒ වගේම අපි වැතිරිලා ඉන්නවා නම් එක කකුලක් අනෙක පිට දමලා ඉන්නකොට උකුළේත්, ඉගේත් හැඩ ඉස්මතුවෙලා පේනවා. ඔය කියන ඉරියව් අඳින්න වැඩි කාලයක් වැය වෙනවා. ඉතින් අපටත් ඒ කාලය තුල ඒ ඉරියව්වෙන් ඉන්න වෙනවා. කෙටි කාලයකින් අඳින ඉරියව්වලදී අපේ අවයව වල මාංශ පේෂීන්වල ක්‍රියාකාරීත්වය දක්වන්න වෙනවා.

ඉහළට එසවෙන අතකත්, ඉණට තියාගෙන ඉන්න අතකත් වැළමිටෙන් ඉහළ මස් ගොබයේ ක්‍රියාකාරීත්වයත්, පිහිටීමත් වෙනස්. ඒ ඒ වෙනස්කම් හඳුනා ගැනීමත්, ඒවා චිත්‍රයට නැංවීමත්, චිත්‍ර අඳින අයට නිර්දේශ කරන අභ්‍යාස. ඒ නිසා තමයි ඒ අයට කාය ව්ච්ඡේදනය අස්ථි පංජරය පිළිබඳව ඉගෙන ගන්න වෙන්නේ. ඒකට අපි කියන්නෙ කාය ව්ච්ඡේදන විද්‍යාව නැත්නම් ඇනටමි කියලා. ඒ ගැන පොත් පත්, ආකෘති එහෙම හරියට තියෙනවා. ඒ වගේම පරිගණක ආශ්‍රයෙනුත් මේ දේවල් දැන ඉගෙන ගන්න පුළුවන්.

මිනිස් සිරුරු විතරක් නෙවෙයි, සතුන්ගේ රූප ඇඳීමේදී පවා මේ දේවල් මුලින්ම හදාරන්න වෙනවා. අතක ඇඟිලිවල අස්ථි පිහිටලා තියෙන හැටි, පේෂීන් පිහිටලා තියෙන හැටි, ඒ වටා හම බැඳිලා තියෙන හැටි නොදැන කොහොමද ලීයක් අල්ලාගෙන ඉන්න අතකයි, බෝලයක් අල්ලාගෙන ඉන්න අතකයි වෙනස අඳුනගන්නේ. චිත්‍ර ලතා ඇහුවේ තවත් කෝපි උගුරකට ඉඩක් හොයා ගන්න ගමන්.

"ඉරියව් තෝරාගන්න කොට මොන වගේ ඉරියව් තෝර ගත්තොත් හොඳද කියන එක ගැන මොනවද චිත්‍රාට කියන්න තියෙන්නේ?"

"අපි මුලින්ම වටහා ගන්න ඕන දෙයක් තමයි මේක කලාවක්ය කියන එක. නිරුවත අලෙවි කරන අදහසින් අඳන චිත්‍රයක් නොවෙන්නට වග බලාගන්න ඕන. කාමුකත්වය යටපත් වෙලා කලාව ඉස්මතු වෙන චිත්‍රයකට ඕන කරන ඉරියව් තෝරාගැනීම වැදගත්.

සාමාන්‍යයෙන් අත්දැකීමෙන් අපි දන්නවා මොන විදිහේ නිරූපණයක් ද කරන්න ඕන කියලා. ඒත් සමහර වෙලාවට හිර වෙන වෙලාවල් තියෙනවා. ඒඅ ර මම මුලින් කිව්වා වගේ සීමාවල් ඉක්මවලා නොයන්න ඉදිරිපත් කිරීම කරන්න වෙන නිසා. ඒ වාගේ වෙලාවට හොඳ උපදේශකයෙකුගෙන් උපදෙස් ගන්න පුළුවන්.

හැම වෙලාවෙම මේ චිත්‍ර අඳින කාණ්ඩායම් මෙහෙය වන්නේ උපදේශකයන් හරි උපදේශිකාවන් හරි තමයි. ඒ අයගේ අත්දැකීම් වැදගත් වෙනවා."

"ඇත්තටම මට නම් දැන් ඒ වාගේ හිරවීම් වෙන්නෙ නැති තරම්. දවස ගානේ එකතුවෙන අත්දැකීම් අතරට දහස් ගණන් ඉරියව් එකතු වෙනවා. මීට කලින් කරපු චිත්‍ර වලින් වැඩි කාලයක් වැය කරන්න වුණ ඉරියව් මගේ මතකයට එනවා. ඒවාට කෙටි කාලීන ඉරියව් මුහුකරලා අළුත් දෙයක් ඉදිරපත් කරන්නත් පුළුවන්."

"විශේෂයෙන්ම කියන්න ඕන දෙයක් තමයි ඉමෝෂන්ස් නැත්නම් හැඟීම් හරියට වැදගත් වෙනවා මේ නිරූපන ඉදිරිපත් කරනකොට. මං හිතන්නේ ඒක හැම කලාවකටම පොදු දෙයක්. සතුට, විශ්මය, දුක වාගේ හැඟීම් කැටි වුණ ඉරියව්වක් ඉදිරිපත් කරනකොට වැදගත් වෙන්නේ මුණේ හැඟීම් විතරක් නෙවෙයි. ඒ හැඟීමට ඉරියව්වත් ගැලපෙන්න ඕන. කණස්සල්ලෙන් ඉන්න කෙනෙකුගේ ඉරියව් වෙනස්, සතුටින් ඉන්න කෙනෙකුට වඩා වැළපෙන කෙනෙක් හුගක් වෙලාවට ඉන්නෙ වාඩිවෙලා, මුහුණ සගවාගෙන. එහෙමත් නැත්නම් වැතිරිලි. නමුත් සතුටේදී එහෙම නෑ. ඉතින් හැඟීම් එක්ක මේ ඉරියව් සමහර වෙලාවට පැය ගණනක් තිස්සේ ඉදිරිපත් කරන්න වෙනවා. ලේසියි කියල ද පින් හිතන්නේ?

"කොහොමද අප්පේ ඔයා ඕවට ඔය හැටි හුරු වුණේ ?" පින් තව කෝපි උගුරකට ඉඩ තිව්වා.

"ඇත්තටම මම මුලින්ම නිරූපනය කරපු චිත්‍ර පන්තිය නිසා හොඳ අවබෝධයක් ලබන්නට මම වාසනාවන්ත වුණා. මුලින්ම රැයවල් අටක් තිස්සේ කරපු ඉදිරිපත් කිරීම් විනාඩි තුනක ඉරියව්වකින් තමයි පටන් ගත්තේ. ඊට පස්සේ විනාඩි තිහක ඉරියව්වක්. විනාඩි තිහේ ඉරියව්වෙන් පස්සේ විනාඩි හතළිස් පහක ඉරියව්වක්. මේ පිළිවෙලට ඉරියව් ඉදිරිපත් කරපු නිසා ක්‍රමයෙන් හැඩ ගැහෙන්න හුරුවෙන්න පුළුවන් වුණා. මේ විදියට මාස දොළහක් තිස්සේ ඉදිරිපත් කරපු ඉරියව්, ලැයිස්තුවක් වගේ මගේ හිතේ රැඳුනා. ඒක මට වෙනත් වලදීත් ප්‍රයෝජනවත් වුණා.

"ඒ වගේම මම අත්දැකීමෙන් ඉගෙන ගත් දෙයක් තමයි අඳින අයට ප්‍රයෝජනවත් ඒවා වැඩකට නැති ඉරියව්වලින් වෙන් කරලා අඳුනාගන්න එක. සමහර ඉරියව් වල කායික වශයෙන් රැඳිලා ඉන්න අමාරුයි. ඒ වගේම සමහර ඉරියව් කලාත්මක නෑ."

"ස්වාභාවික ඉරියව්වල ඉන්න නිරූපිකාවන් එක්ක කරන චිත්‍ර පන්තියක් ඉවර වුණාම, ඒ හැමෝටම පහසු, නිදයස් බවක් දැනෙනවා. ලීයෙන් හදලා වගේ ඉරියව් ඉදිරිපත් කරන්නේ කලබලකාරී මනසක් තියෙන නිරූපිකාවන්. මම උනන්දු වන්නේ කලාත්මක කාය රේඛා මැවෙන විදියට ශරීරය, අත්, පා විහිදිලා යන විදියට පුටුවක හරි ඇඳක හරි ඉඳලා ඉරියව් ඉදිරිපත් කරන්න...." චිත්‍ර ලතා ජංගම දුරකථනයෙන් වෙලාව බැලුවා.

"මට යන්න වෙලාව නං හරි, පින්. ඔය ඇති නේද අදට?" දෙන්නාගෙම "කැපිච්නෝ" කෝපි කොප්ප දෙක ඉවරවෙලා.

"හොඳා එහෙනම්........ බොහොම ස්තුතියි ලබා දුන්න තොරතුරු වලට. ආයෙත් වෙලාවක මුණගැහෙමුකෝ....."

පින් කට කොණක තැවරිලා තිබුණ "කැපිච්නෝ" පෙණ ටික පිටි අත්ලෙන් පිහි දා ගත්තා.

MONT ALBERT DENTISTS P/L
For all Your Dental Requirements
We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES
WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.
FOR APPOINTMENTS 9890 3609
DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS
DR. ENOKA JAYATILAKEBANDA (BDS)
MONT ALBERT DENTISTS
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)
www.montalbertdentists.com.au